සියලුම හිමිකම් ඇවිරිණි
All Rights Reserved

# වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

# පළමු වාර පරීක්ෂණය 2018

6 ශ්‍රේණිය **බුද්ධ ධර්මය** කාලය පැය 02 යි

| නම/ විභාග අංකයඃ |
|---|

## I - කොටස

සැලකිය යුතුයි

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 තෙක් ප්‍රශ්නවල නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01 බෝසතාණන් වහන්සේ මව්කුස පිළිසිඳ ගත්තේ කුමන පොහෝ දිනකද?

(i) වෙසක් (ii) පොසොන් (iii) ඇසල

02 බෝසතාණන් වහන්සේ ''අග්ගෝ හමස්මි ලෝකස්ස'' යනුවෙන් ප්‍රකාශ කළේ,

(i) 'මම ලොවට අග්‍ර වෙමි' යන්නයි.

(ii) 'මම ලොවට ජ්‍යෙෂ්ඨ වෙමි' යන්නයි.

(iii) 'මම ලොවට ශ්‍රේෂ්ඨ වෙමි' යන්නයි.

03 බෝසත් කුමරුගේ නම් තැබීමේ මංගල්‍යයට කැඳවූ බමුණු පඬිවරුන් ගණන,

(i) 108 කි. (ii) 8 කි. (iii) 7 කි.

04 බුදුබව ලබා පළමුව මගේ රාජ්‍යයට වඩින්නැයි සිදුහත් තාපසතුමාගෙන් ඉල්ලා සිටියේ,

(i) සුද්දෝධන රජතුමා ය. (ii) බිම්බිසාර රජතුමා ය. (iii) සුප්‍රබුද්ධ රජතුමා ය.

05 බෝසතාණන් වහන්සේට මධ්‍යම යාමයේ දී පහළ වූයේ,

(i) පුබ්බේනිවාසානුස්සති ඥාණයයි.

(ii) චුතුපපාත ඥාණයයි.

(iii) අසවක්ඛය ඥාණයයි.

- **අංක 06 සිට 10 තෙක් ප්‍රශ්නවල දැක්වෙන වගන්ති හරි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✗) ලකුණ ද ඉදිරියෙන් දී ඇති වරහන තුළ යොදන්න.**

06 මහ බෝසතාණන් වහන්සේ මව්කුසින් බිහිවූයේ ලුම්බිණි නම් සල් උයනේදී ය. ( )

07 සුද්දෝධන රජතුමා තම පුතුට මුලින් ම වැන්දේ වප් මඟුල් උළෙල පැවැත්වූ දිනයේදී ය. ( )

08 සිදුහත් කුමරු සරණ පාවාගත්තේ සුප්‍රබුද්ධ රජුගේ දියණියයි. ( )

09 අනෝමා ගංතෙරේ දී සිදුහත් කුමරුට සිවුරු පිරිකර ලබාදුන්නේ සහම්පතී බ්‍රහ්මයා ය. ( )

10 පුද්ගලයකුගේ දියුණුව සඳහා උපකාරී වන කරුණු හයක් අන්ඨස්සද්වාර ජාතකයෙහි පෙන්වා ඇත. ( )

- **අංක 11 සිට 15 තෙක් ප්‍රශ්නවල දී ඇති වගන්තිවල හිස්තැනට සුදුසු වචන වරහන තුළින් තෝරා ඊට යටින් ඉරක් අඳින්න.**

11 මහා මායා දේවිය ඇතුළු පිරිස අලංකාර පෙරහැරකින් තම මව්පියන් ජීවත් වන .................................. නුවර බලා යාමට පිටත් විය. (කිඹුල්වත් / දෙව්දහ)

12 බෝසත් කුමරු ඉපදුණේ .......................................................................... පොහෝ දිනකය. (වෙසක් / ඇසළ)

13 සිදුහත් කුමරු ශිල්ප ඉගෙන ගත්තේ .................................. නම් බමුණු පඬිවරයාගෙන් ය. (අසිත / සර්වමිත්‍ර)

14 පන්සලට ගොස් මුලින්ම වන්දනාමාන කළ යුත්තේ ...................................................... වහන්සේට ය. (වෙහෙර / බෝධීන්)

15 ................................................................................ ගාථා නවයකින් බුදු සිරුර වර්ණනා කළාය. (යසෝදරා දේවිය / කිසාගෝතමී කුමරිය)

- **අංක 16 සිට 20 තෙක් ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශවල දැක්වෙන හිස්තැන් වරහන් තුළින් නිවැරදි වචන තෝරාගෙන සම්පූර්ණ කරන්න.**

(සොත්ථිය / භග්ගව / කාලදේවල / කාළුදායි / සහම්පතී / ඡන්න / ආලාරකාලාම / ඝටීකාර)

16 ................................................................................ මහා බ්‍රහ්මයා ප්‍රමුඛ දෙව්වරු දේවාරාධනාව කළහ.

17 සිදුහත් කුමරු දැකීමට පැමිණ පළමුව සිනාසී දෙවනුව හැඬුවේ ........................................................ තවුසා ය.

18 සිදුහත් බෝසතාණන් වහන්සේට කුස තණ අට මිටක් පූජා කළේ .................................................... බමුණා ය.

19 රජසැප හැරදමූ සිදුහත් කුමරු මාලිගයෙන් නික්ම ගියේ ........................................................... ඇමති සමඟ ය.

20 අභිනිෂ්ක්‍රමණයෙන් පසු සිදුහත් බෝසතාණෝ පළමුව ධර්මය ඉගෙන ගැනීමට පැමිණියේ ................................................................ තවුසා වෙතය.

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

- **පළමුවන ප්‍රශ්න ඇතුළුව ප්‍රශ්න 5 කට පමණක් පිළිතුරු ලියන්න.**

01 කෙටි පිළිතුරු සපයන්න.

(i) සිදුහත් කුමරු ආසන්න භවයේ දී දිව්‍ය පුත්‍රයකු වී සිටියේ කුමන දෙව්ලොව ද?

(ii) සිදුහත් කුමරුගේ දෙමව්පියන්ගේ නම් ලියන්න.

(iii) සිදුහත් කුමරුගේ සුළු මව් වූයේ කවුරුන් ද?

(iv) වප් මඟුල් දිනයේ දී සිදුහත් කුමරු වඩමින් සිටි භාවනාව කුමක් ද?

(v) සිදුහත් කුමරු සමග එකට හැදුණු කුමාරවරුන් දෙදෙනෙකුගේ නම් ලියන්න.

(vi) සිදුහත් තවුසාණන් කොපමණ කාලයක් දුෂ්කර ක්‍රියා කළේ ද?

(vii) 'මුසාවාදා වේරමණී සික්ඛාපදං සමාදියාමි' යන්නෙහි තේරුම ලියන්න.

(viii) සුගන්ධිකාය වදනං - අනන්ත ගුණ ගන්ධිනා ..... යන ගාථාව කියමින් පූජා කරන්නේ මොනවා ද?

(ix) පහත වචනවලට අදාළ ශාසනික වචනය බැගින් ලියන්න.

(අ) වතුර (ආ) නිදනවා

(x) අත්ථස්සද්වාර ජාතකය ඇතුළත් පොත කුමක් ද? (ලකුණු 2 x 10 = 20)

02 (i) සිදුහත් කුමරු දුටු සතර පෙර නිමිති මොනවා ද? (ලකුණු 02 යි.)

(ii) සිදුහත් උපත සමග සිදු වූ අසිරිමත් සිදුවීම් තුනක් ලියන්න. (ලකුණු 03 යි.)

(iii) සිදුහත් කුමාර චරිතයෙන් ශිෂ්‍යයෙකුට ගතහැකි ආදර්ශ මොනවා ද? (ලකුණු 05 යි.)

03 (i) පන්සල් භූමියට ඇතුළුවීමේ දී නොපැළඳිය යුතු දේවල් දෙකක් ලියන්න. (ලකුණු 02 යි.)

(ii) පන්සලේ දී පූජා කිරීම සඳහා රැගෙන යා හැකි දේවල් හයක් ලියන්න. (ලකුණු 03 යි.)

(iii) පන්සලේ පවිත්‍රතාවය සඳහා ඔබට කළ හැකි දේවල් පහක් ලියන්න. (ලකුණු 05 යි.)

04 (i) බුදුරජාණන් වහන්සේ රාහුල කුමරුන්ව පැවිදි කිරීම සඳහා භාරදුන්නේ කාහට ද? (ලකුණු 02 යි.)

(ii) රාහුල හාමුදුරුවෝ දිනපතා පාන්දරින් නැගිට වැලි දෝතක් ගෙන අහසට දමා කළ ප්‍රාර්ථනය ලියන්න. (ලකුණු 03 යි.)

(iii) රාහුල හාමුදුරුවන්ගේ චරිතයෙන් ලබාගත හැකි ආදර්ශ පහක් ලියන්න. (ලකුණු 05 යි.)

05 (i) මෛත්‍රිය යනු කුමක් ද? (ලකුණු 02 යි.)

(ii) මෛත්‍රී භාවනාව වඩන පිළිවෙළ ලියා දක්වන්න. (ලකුණු 03 යි.)

(iii) මෛත්‍රී භාවනාවේ ආනිශංස පහක් ලියන්න. (ලකුණු 05 යි.)

06 (i) ඔබ නොදන්නා දෙය අසා දැනගන්නේ කාගෙන් ද? (ලකුණු 02 යි.)

(ii) පහත සඳහන් ශාසනික වචනවල අර්ථය ලියන්න.

(අ) ආරෝග්‍ය (ආ) සීලං (ඉ) සුතං (ලකුණු 03 යි.)

(iii) අත්ථස්සද්වාර ජාතකයෙහි දැක්වෙන දියුණුවීමේ දොරටු පහක් ලියන්න. (ලකුණු 05 යි.)

## පිළිතුරු පත්‍රය - I කොටස

| | | | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| (01) | i | (02) | iii | (03) | i | (04) | ii | (05) | ii | (06) | ✓ | (07) | ✗ | (08) | ✓ |
| (09) | ✗ | (10) | ✓ | (11) | දෙව්දහ | (12) | වෙසක් | (13) | සර්වමිත්‍ර | (14) | වෙහෙර | | | | |
| (15) | යසෝදරා දේවිය | (16) | සහම්පතී | (17) | කාලදේවල | (18) | සොත්ථිය | (19) | ඡන්න | | | | | | |
| (20) | හග්ගව | | | | | | | | | | | | | | |

(ලකුණු 2 x 20 = 40)

## II කොටස

01 (i) කුසිත දෙව්ලොව (ii) සුද්දෝධන රජු, මහාමායා දේවිය

(iii) මහා ප්‍රජාපතී ගෝතමී දේවිය (iv) ආනාපාන සති භාවනාව

(v) නන්ද හා කාළුදායි (vi) වසර හයක්

(vii) මම බොරුකීමෙන් වැළකෙමි (viii) සුවඳ දුම්

(ix) (අ) පැන් (ආ) සැතපෙනවා

(x) පන්සිය පනස් ජාතක පොත (ලකුණු 2 x 10 = 20)

02 (i) මහල්ලෙක්, රෝගියෙක්. මළ සිරුරක්. පැවිදි තවුසෙක් (ලකුණු ½ x 4 = 02)

(ii) සතරවරම් දෙවිවරු සාධුකාර පැවැත්වීම / අහසින් සසිල් හා උණුසුම් දිය දහරා මතුවීම / සත් පියුම් මත වැඩි කුමරු සිංහනාද පැවැත්වීම (ලකුණු 1 x 3 = 03)

(iii) කරුණාවන්ත බව / වීර්යසම්පන්න බව / කීකරු වීම / අන්‍යයන්ට ගරු කිරීම / සන්සුන් බව වැනි ඕනෑම කරුණු 5 ක් (ලකුණු 1 x 5 = 05)

03 (i) හිස්වැසුම් හා පාවහන් (ලකුණු 02 යි.)

(ii) මල්, පහන්. තෙල්. සුවඳ දුම්, ගිලන්පස, පිරිකර වැනි දේවල් (ලකුණු ½ x 6 = 03)

(iii) පරමල් ඉවත් කිරීම / මළුව හා පාරවල් ඇමදීම / තණකොළ ඉවත් කිරීම / කුණුරොඩු ඉවත් කිරීම / මකුළු දැල් කැඩීම ආදී ඕනෑම කරුණු පහක් (ලකුණු 1 x 5 = 05)

04 (i) සැරියුත් මහ තෙරුන් වහන්සේ වෙත (ලකුණු 02 යි.)

(ii) ''මේ වැලි දෝතේ වැලි කැට ප්‍රමාණයට මට ගුරුවරුන්ගේ අවවාද ලැබේවා !'' (ලකුණු 03 යි.)

(iii) කීකරුකම, අවවාද පිළිගැනීම, ඇත්ත කතා කිරීම, හරි වැරදි හඳුනාගෙන ක්‍රියා කිරීම, අනතිමානී බව වැනි කරුණු (ලකුණු 1 x 5 = 05)

05 (i) 'මිතුරු සිතක් තිබීම' මෙම අර්ථය ඇති පිළිතුරකට (ලකුණු 02 යි.)

(ii) මම නිදුක් වෙම්වා ! නිරෝගී වෙම්වා ! සුවපත් වෙම්වා !

මා මෙන් ම සියලු සත්වයෝ

නිදුක් වෙත්වා ! නිරෝගී වෙත්වා ! සුවපත් වෙත්වා ! (ලකුණු 03 යි.)

(iii) සුවසේ නිදයි / සුවසේ පිබිදෙයි / පාපී සිහින නොදකියි / මනුෂ්‍යයන්ට ප්‍රියවේ / අමනුෂ්‍යයන්ට ද ප්‍රියවේ / දෙවියන් රැකගනී ආදී ඕනෑම 5 ක් (ලකුණු 1 x 5 = 05)

06 (i) දෙමව්පියන්ගෙන්, ගුරුවරුන්ගෙන්, වැඩිහිටියන්ගෙන් ආදි ඕනෑම පිළිතුරු දෙකක් (ලකුණු 1 x 2 = 02)

(ii) (අ) නිරෝගී කම (ආ) ශීලාචාරකම (සිල්වත් බව) (ඉ) ඉගෙනගෙන තිබීම (ලකුණු 03 යි.)

(iii) නිරෝගි බව / සිල්වත් බව / වැඩිහිටියන්ගේ උපදෙස් ලැබිම / හොඳ ඉගෙනීමක් තිබිම / දැහැමිව ජීවත් විම / කම්මැලි නොවීම යන කරුණුවලින් 5 ක් (ලකුණු 1 x 5 = 05)